# ප්‍රීතිමත් ගමන

කාන්තා මිත්‍ර සංගමය, කොළඹ 3

මැයි - අගෝස්තු 2024

## සභාපතිනියගේ සිතුවිලි

හිතවත් සාමාජිකාවන් වෙත,

ශ්‍රී ලංකා, කාන්තා මිත්‍ර සංගමය 2024 මැයි මස සිට අගෝස්තු මස දක්වා අපගේ පිටපළාත් ශාඛාවන්හි විශිෂ්ට ලෙස කරන ලද වැඩසටහන් ගණනාවක කැපී පෙනෙන සාර්ථකත්වය ගැන මහත් ප්‍රීතියෙන් මතක්කරමි. මේ සියල්ල දෙවියන්වහන්සේගේ කරුණාව සහ අනුග්‍රහයේ සාක්ෂින්ය“

යෙරෙමියා 29:11 “මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි, නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනායයි ස්වාමින්වහන්සේ කියනසේක”

මෙම පදය තුලින් අපට නිරන්තරව සිහි ගන්වනු ලබන්නේ දිව්‍යමය මඟ පෙන්වීම සහ ආශිර්වාදය අපගේ සමාජයේ ඉදිරි ගමනට දිරි ගැන්වීමේ සමුළුව පිළිබඳවයි.

ශ්‍රී ලංකා, කාන්තා මිත්‍ර සංගම අඛණ්ඩව සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර 2026 දී ශ්‍රී ලංකාවේ ලෝක කවුන්සිලයේ සත්කාරත්වය දැක්වීමට උනන්දුවෙන් අපේක්ෂා කරමු. මෙම වැදගත් අවස්ථාවට අපි සූදානම් වෙමින් සිටින අතර, එය අපගේ සමාජයට ඇති කරන ධනාත්මක බලපෑම් පිළිබඳව අපි සතුටු වන්නෙමු. ඔබගේ අඛණ්ඩ කැපවීම සහ සහයෝගය ගැන ස්තූතියි. අපි එක්ව කාන්තා මිත්‍ර සංගමයට සහ එහි සාමාජිකාවන්ට දීප්තිමත් අනාගතයක් ගොඩ නඟමින් සිටිමු.

උණුසුම් සුභ පැතුම්

*රෝහිනී රත්නම්*

### දැනට පවතින ව්‍යාපෘතීන්

- දිවයිනේ විවිධ ශාඛාවන්හි කාන්තා මිත්‍ර සංගම් රැස්වීම් සහ යාච්ඤා රැස්වීම් පවත්වන ලදී.
- ක්‍රිස්තුධර්මය උගන්වන්නට ගුරුවරුන් නැති පාසැල් කිහිපයක ළමුන් 9 දෙනෙකු සඳහා හම්බන්තොට කලාප කාර්යාලයේ පන්ති පැවැත්වුනි.
- මව්වරුන් තිදෙනෙක්, තරුණ ගැහැණු ළමුන් තිදෙනෙක් සහ එක් පිරිමි දරුවෙක් වෙනුවෙන් හම්බන්තොට කලාප කාර්යාලයේදී පරිඝනක පන්තියක් පැවැත්වුණි.
- කොළඹ මූලස්ථානයේ කොළකැඳ ව්‍යාපෘතිය.
- මස්කෙලිය, සියලු සාන්තුවරයන්ගේ දේවස්ථානයේ සබත්පාසැල් දිවා ආහාර වේල.
- දික්ඔය කලාප කාර්යාලයේ තේ ව්‍යාපෘතිය.

### 2024-මැයි සිට අගොස්තු දක්වා සිදු කෙරුනාවු විශේෂ අවස්ථාවන්.

- අක්ෂි කඳවුරට සම්බන්ද හරිෂාන්ගේ සාර්ථකත්වයේ කතාව.
- පරිසර දිනය සැමරීම.
- කලාපීය සම්බන්ධීකාරක නිලධාරිනියන්ගේ සංචාරය.
- අගරපතන සියලු ශාන්තුවරයන්ගේ සභාවට කළ පළමු චාරිකාව.
- දික්ඔය ක්‍රිස්තු දේවස්ථානයේ කාන්තා මිත්‍ර සංගම් ශාඛාවේ, වෙළඳ කුටි.
- කාන්තාවන්ගේ කෝපි සන්ධ්‍යා සාදය.

GFS GLOWS!



## දෙවිදුන්තුල විශ්වාසයෙන් යන්නාවූ ගමන. . . . . .



ක්‍රිස්තුස්වහන්සේ තුළ ආ මෙම ජිවිතයේ මෙතෙක් මා සේවය කල ස්ථාන බොහොමයක් පසුකරමින් මේ වන විට වසර තුනකට ආසන්න කාලයක් කාන්තා මිත්‍ර සංගමය සමග ගත කර ඇත. එය මාගේ තේරීමක් හෝ මාගේ සැලැස්මක් නොවන අතර එය දෙවියන් වහන්සේගේ කැමැත්ත හා සැලැස්ම බව මම විශ්වාස කරමි. එම කාලය තුල මා අත්විදි බොහෝ දේ ඇත. විශේෂිතම කරුණ නම් අප හිතනවාට වඩා බොහෝ දේ උන්වහන්සේ අන්‍යයන් වෙනුවෙන් අප තුලින් ක්‍රියාත්මක කරවීමයි.

අප කාන්තාමිත්‍ර සංගමය හරහා කාන්තාවන් හා දරුවන් වෙනුවෙන් බෝහෝ සේවාවන් ක්‍රියාත්මක වන අතර ඒ සදහා දෙවියන්වහන්සේ අපව පාවිච්චි කරන ආකාරය ගැන ආපසු හැරී බලන කළ එහි වටිනාකම අපටද සිතාගත නොහැකි තරමිය. කාන්තාවන්, දරුවන්, තරුණයන් අතර කරන්නාවූ සේවාව ඉතා පහසු කාර්යක් නොවූවද එය ඉතාමත් ආත්ම තෘප්තියක් ගෙනෙන සේවාවකි. එදිනෙදා ජිවිතයේ කාන්තාවන් බොහෝ වෙහෙස මහන්සි වී කටයුතු කරන අතර කිතුණු කාන්තාවන් වශයෙන් ඔවුන් තම අධ්‍යාත්මික පෝෂණය වෙනුවෙන් බොහෝ කටයුතු කරන අයවෙති. මෙය ඇන්ග්ලිකානු සභාවේ කාන්තාවන්ට කාන්තා මිත්‍ර සංගමයෙන් ලැබුන විශේෂිත අවස්ථාවක් ලෙස හැදින්විය හැක.

වසර ගණනාවක් අප සංගමය දෙවියන්වහන්සේගෙ කරුණාවෙන් මෙතෙක් දුර පැමිණ අතර විවිධ වූ සේවාවන් කිරීමට අපව පාවිච්චි කිරීමද මා ලද භාග්‍යක් කොට සලකමි.

**තුෂාරි ප්‍රනාන්දු**
**කලාප කාර්යාල සම්බන්ධිකාරක නිලධාරිනි - හම්බන්තොට**



## කාන්තා මිත්‍ර සංගමය එක්ව කරන සේවයේ තොරතුරු බිඳක්

ඔම රාජ්‍ය සේවයෙන් විශ්‍රාමා ලත් ගුරුවරියක් වන අතර විශ්‍රාමයෙන් පසු කාන්තා සේවයෙහි නියැලීමට ලැබීම ගැන මගේ ස්වර්ගික පියාණන්වහන්සේට ස්තුතිවන්ත වෙමි. මෙය මට අලුත් ක්ෂේත්‍රයක් බැවින් යම් යම් අභියෝගයන් එක්ක ප්‍රතිලාභින්ගේ යහපත තකා සෙමින් මගේ ගමන යමින් සිටිමි.

සීමිත පරිගණක දැනුමක් ලබා ඇති මට අවශ්‍ය පුහුණුව කාන්තා මිත්‍ර සංගමයේ කණ්ඩායම විසින් ලබා දෙන මඟපෙන්වීම ගැන අගය කොට සලකමි.

මම සේවය කල රජයේ පාසැල් හයකම කළමණාකරණයට අදාල සෘජු ව්‍යුවහයක් තිබුන බවද මතක් කරමි. මෙය මට ලැබුනාවූ විශේෂ වරප්‍රසාදයකි. මහිමය යේසුස් වහන්සේටය. මෙය තව දුරටත් ඔප මට්ටම් කර ගැනිම සඳහා කාන්තා මිත්‍ර සංගමය තුල තිබෙන්නාවූ සංවිධානාත්මක කළමණාකරනයේ විනිවිදභාවය ඉතාමත් ආකර්ෂණියයි. මෙම සංගමයේ තව දුරටත් සේවය කිරීමට මාව වැඩි වැඩියෙන් පොළඹවා උනන්දු කරවයි.

සමාජයේ කොන්වී සිටින දරුවන් සහ කාන්තාවන්ගේ යහපත උදෙසා කරන ක්‍රියාකාරකම් සහ වැඩසටයන්හි ශාඛාවේ නිළධාරිනියන් සහ විධායක කමිටු සාමාජිකයන් අප සමඟ එක්ව ස්වෙච්ජාවෙන් කටයුතු කරන්නේය.

මුල්‍යයමය අර්බුදයන්වලට මහුණපාන කාන්තාවන් රැකියා කල යුතුව ඇත. පවුලේ වැඩකටයුතු සමඟ අප සංගමය හා එක්ව සේවය කරන නිළධරීනියන් වෙනුවෙන් ස්තුති වන්ත වෙමි. එමෙන්ම ගරු පියතුමන්ලාගෙන් ලැබෙන්නාවූ මඟ පෙන්වීම හා දිරිගැන්වීමට මාගේ ස්තුතය පුද කරමි.

**ජෙමීමා මෝසස්**
**කලාප කාර්යාල සම්බන්ධිකාරක නිලධාරිනි - දික්ඔය**

# ඔරේන්ජ් ඩේ

## කාන්තා මිත්‍ර සංගමයේ අඛණ්ඩ ව්‍යාපෘතීන්

5 GENDER EQUALITY

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

**එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක 5**
**ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලු කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.**
2 සාමුවෙල් 22:3




කාන්තා මිත්‍ර සංගමය මගින් **මඩකලපුව ශාන්ත ඇන්ඩෲ දේව ස්ථානයේ** ළමා අපචාරය පිළිබඳව දමිළ වීඩියෝ උපයෝගී කර ගනිමින් 2004 අප්‍රේල් 11 වන දින මෙම වැඩ සටහන පවත්වන ලදි. ප්‍රබෝධමත් උදෑසනක සහභාගිවූවන්හට රෝල්ස් සහ වඩේ සමඟ තේ සංග්‍රහයක් කරමින් වැඩ සටහන අවසන් කරන ලදි.

මෙම වැඩ සටහන දහවල් 12 වන විට අවසන් වූයේ ගරු ජනගන් පියතුමන්ගේ යාච්ඤාවෙන් අනතුරුවයි.

**අගරපතන සියලු ශාන්තුවරයන්ගේ දේව ස්ථානයේ** පිහිටි කාන්තා මිත්‍ර සංගමයේ ශාඛාව විසින් මෙම වැඩ සටහන ජුනි මස 30 වන දින එක්සත් ජාතීන්ගේ සංවර්ධන ඉලක්කයට අනුව මෙන්ම ඔරේන්ජ් ඩේ සංකල්පයට අනුකූලව පවත්වන ලදි. සමහර කාන්තාවන් සහ ළමයින් තැඹිලි පාටින් සැරසී සිටියහ. කාන්තා මිත්‍ර සංගමයේ කාන්තාවන් දස දෙනෙක් සහ එක් ගැහැණු ළමයෙකු ඇතුළුව කාන්තා මිත්‍ර සංගමයේ කාර්යාල නිළධාරිනියන්ද සහභාගි වූහ.

ප්‍රචණ්ඩත්වය සහ අපයෝජනයට නිසි ලෙස ප්‍රතිචාර දැක්වීම සහ එවැනි අවස්ථාවන්හි ක්‍රියාශීලි විය යුත්තේ කෙසේද යන්න අවධාරණය කරමින් ශාඛාවේ සභාපතිනිය වන රංජනී රොබින්සන් මහත්මිය පණිවුඩයක් බෙදා ගත්තාය. අගරපතන සියලු ශාන්තුවරයන්ගේ දේවස්ථානයේ කාන්තා මිත්‍ර සංගමය විසින් මෙම වැඩ සටහන 2024 අගෝස්තු 25 වන දින පවත්වන ලදි.

කාන්තා මිත්‍ර සංගමයෙන් තෝරා ගන්නා ලද ඉහත එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සාර්ථක කර ගැනීමට දායක වීමේ උත්සාහයක් ලෙස **බොගවන්තලාව ශාන්ත මරියා දේව ස්ථානයේ** ශාඛාව අඛණ්ඩව වැඩ සටහන් පවත්වනු ලබයි. සමහර කාන්තාවන් සහ ළමයින් තැඹිලි පාටින් සැරසී සිටියහ. තමන්ගේ නිවෙස්වලදී නිර්මාණය කරන ලද ළමා අපචාරය පිළිබඳ පෝස්ටර් සහ චිත්‍ර දේවස්ථාන පරිශ්‍රය ඉදිරිපිට ප්‍රදර්ශනය කර තිබුනි.

කාන්තා මිත්‍ර සංගමයේ සාමාජිකාවක් වන දේවිකා ඩැනියල් මහත්මිය **හොඳ ස්පර්ශය සහ නරක ස්පර්ශය** පිළිබඳ ප්‍රායෝගිකව පැහැදිලි කිරීමක් කළාය.

සැම මාස දෙකකට වරක් ඔරෙන්ජ් ඩේ වැඩ සටහන් පැවැත්වීමට සාමාජිකාවෝ තීරණය කළහ.

**එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක 13**
**මැවීම ගැන සැලකිලිමත් වීමෙන් දේශගුණික විපර්යාස මැඩලීම.**
ගීතාවලිය 104:10-25

13 CLIMATE ACTION

## දේශගුණික ක්‍රියාවලිය

ක්‍රිස්තියානි අධ්‍යයනයට සහභාගි වන ළමුන්ට අත්වැලක් සඳහා හම්බන්තොට ප්‍රාදේශිය කාර්යාලය විසින් ජුනි මස 7 වන දින සන්ධ්‍යාවේ ලෝක පරිසර දිනය සමරන ලදි.

මෙහි ප්‍රධාන අරමුණ වූයේ දෙවියන්වහන්සේ විසින් ලබා දී ඇති පරිසරය සහ සෞන්දර්යය රැක ගැනීමේ වැදගත්කම දරුවන්ට කියා දීමයි.





සැම දරුවෙකු විසින්ම චිත්‍රයක් අඳින ලද අතර, වැඩ සටහනට සහභාගි වූ සැම දරුවෙකුටම එළවළු පැළයක් ලබා දී එයට සාත්තු කර රැක බලා ගන්නා ආකාරය උගන්වන ලදි.

## දික්ඔය ඉරිදා සබත් පාසැල් ළමුන් සමඟ ලෝක පරිසර දිනය සැමරීම.

ජුනි 16 වන දින දික්ඔය ක්‍රිස්තු දේවස්ථානයේ කාන්තා මිත්‍ර සංගමයේ ශාඛාව විසින් දෙවියන් වහන්සේගේ මැවීම පිළිබඳ වටිනාකම පෙන්වා දීමට රුක් රෝපණ වැඩ සටහනක් සංවිධානය කරන ලදි. මෙම වැඩ සටහන සඳහා සබත් පාසැල් ළමුන් 62 හා ගුරුවරුන් 5 දෙනෙක් සහභාගි වීම ප්‍රශංසනීයයි. ළමයින් විසින් තම නිවෙස්වලින් ගෙනා පැළ මෙන්ම රෝස, ඇන්තූරියම් මල් හා අඹ, පැපොල් වැනි පළතුරු පැළ ද රෝපණය කරන ලදි.

කාන්තා මිත්‍ර සංගමයේ ලෝක අරමුණ සහ දේශීය වාර්ෂික මෙහෙයුම් සැලැස්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ශාඛාවේ කැපවීම මෙන්ම කාන්තා මිත්‍ර සංගමයේ වැඩකටයුතු වෙනුවෙන් ගරු එස්. කේ. ඩැනියෙල් පියතුමන්ගේ උද්යෝගිමත් මඟ පෙන්වීම ගැනද එතුමන්ට විශේෂ ස්තුතිය පුද කරමු.



## උඩරට ප්‍රදේශිකයේ නුවරඑළිය අනුනායක බල ප්‍රදේශය බැහැදැකීමේ පසුවිපරම

අගරපතන සියළු සාන්තුවරුන්ගේ දේව ස්ථානයේ පැවති අක්ෂි කඳවුර සහ ගෙවතු වගා ව්‍යාපෘතියෙන් පසු කාන්තා මිත්‍ර සංගමයේ ප්‍රධාන විධායක නිළධාරිනි දේවිනි තිස්සාරච්චි, සම්බන්ධීකාරක මර්සි අරුලානන්දම් යන මහත්මීන් සහ උඩරට ප්‍රාදේශීය සම්බන්ධීකාරක ජෙම්මා මෝසස් යන අය විසින් 2024 මැයි 10 සිට 11 වන දින වල පසු විපරම් චාරිකාවක් කරන ලදි.

### අක්ෂි කඳවුර පිළිබඳ පසුවිපරම

ප්‍රධාන විධායක නිළධාරිනිය සහ ප්‍රාදේශීය සම්බන්ධීකාරක නිළධාරිනිය ත්‍රිරෝද රථයකින් දුෂ්කර කඳුකර ඉහළ කොට්ඨාශයේ පිහිටි ඩන්කල්ඩ් වතුයායට ගියහ. ඔවුන්ගේ පළමු නැවතුම වූයේ හරීෂාන්ගේ නිවසයි. ඒ ඔහුගේ ඇස් පෙනීම සම්බන්ධව සොයා බැලීමටයි.

හැකි ඉක්මණින් හැටන් ප්‍රදේශයේ අක්ෂි වෛද්‍යවරයෙකු හමුවී අක්ෂි පරීක්ෂණයක් කරගැනීමට අවශ්‍ය තොරතුරු රැස් කර ගන්නා ලදි. යේසුස් වහන්සේගේ ප්‍රේමය හරීෂාන් සහ ඔහුගේ නැන්දා සමඟ බෙදා ගත් අතර ඔවුන් වෙනුවෙන් යාච්ඤා කර සමුගන්නා ලදි.

රළු පාරවල් ඔස්සේ කිලෝ මීටර් 6ක වෙහෙසකාරී ගමන දිගටම කඳුකර ඉහළ කොට්ඨාශයේ පිහිටි ඩන්කල්ඩ් වතුයායයේ පෙරුමාල් සහ තනලෙට්චුමිගේ පුතා, ලේලි සහ ඔවුන්ගේ මුණුබුරන් තිදෙනා ජීවත් වන (අබලන් වුන ලයින් කාමරය) ඇති ප්‍රදේශයට ළඟා වූහ.

මෙම යුවල සහ ඔවුන්ගේ පවුලේ අය ජීවත් වන තත්ත්වය සැබවින්ම හද කම්පා කරවන සුළුය. මෙම විශේෂිත ලයින් කාමර අලුත්වැඩියා නොකර තිබීම දැකීමට අවුල් සහගත දෙයකි. විශේෂයෙන්ම කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට නෑම සඳහා සම්පූර්ණ ආරක්ෂිත ස්ථානයක් නොතිබුණි.

මෙම යුවලට හැටන් ප්‍රදේශයේ අලුත් අක්ෂි ශල්‍ය වෛද්‍යවරයා හමුවීම සඳහා ත්‍රිරෝද රථයක් සූදානම් කරන ලදි. ඉදිරි ක්‍රියාමාර්ගය තීරණය කරනු ලබන්නේ වෛද්‍ය වරයාගේ නිර්දේශය මතය. කණ්ඩායම පිටත්වන්නට පෙර පවුලේ අවසරය ඇතුව ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරන ලදි.

## ගෙවතු ව්‍යාපෘතිය

වටවල ශාඛාවේ කාන්තා මිත්‍ර සංගමයේ භාණ්ඩාගාරික කවිදා මහත්මිය සහ ඇගේ දියණිය වන විනෝදිනිව කණ්ඩායම විසින් බැහැ දකින ලදි.

මෙහි මූලික අරමුණ වූයේ කුඩා කණ්ඩායම් රැස්වීමට සහභාගිවීම සහ ගෙවතු වගාව නිරීක්ෂණය කිරීමය. අනපේක්ෂිත ලෙස ඇදහැළුනු අධික වර්ෂාව හේතුවෙන් සාමාජිකයින්ට රැස්වීමට පැමිණීමට නොහැකි වූ අතර ගෙවතු වගාව ද නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

කෙසේ හෝ ඵලදායි සාකච්ඡාවක් සහ යාච්ඥාවක් පවත්වන්නට හැකි වුණි.

මැයි මස 11 වන දින අගරපතන සිට පැමිණිය පසු දික්ඔය පිහිටි කාන්තා මිත්‍ර සංගම් ශාඛාවේ ක්‍රිෂ්ණවේනි සාමාජිකාව මුණගැසුනි. මෙම පවුලට ගෙවතු වගාවක් තිබෙන අතර ගෙවතු ව්‍යාපෘතිය මඟින් අමු මිරිස්, බිට්රූට් සහ බටු පැළ ලබා දෙන ලදි. ක්‍රිෂ්ණවේනි සහ ඇයගේ සැමියාට පුංචි පුතෙක් සහ දියණියක් සිටියි.

## අගරපතන සියලු ශාන්තුවරයන්ගේ සභාවට කළ පළමු චාරිකාව

අගරපතන සියලු ශාන්තුවරයන්ගේ සභාව ඔවුන් බැහැ දැකීම සම්බන්ධව දිගු කාලයක් බලා සිටීමෙන් අනතුරුව එහි පළමු චාරිකාව ප්‍රධාන විධායක නිළධාරිනී, සම්බන්ධීකාරක නිළධාරිනී සහ උඩරට ප්‍රදේශයේ කලාපීය සම්බන්ධීකාරක නිළධාරිනී විසින් මැයි 11 වන දින සිදු කරන ලදි. ඔවුන්ට කාන්තාවන් විසින් මල් කළඹක් පිරිනමමින් උණුසුම් පිළිගැනීමක් ලබා දෙන ලදි.

කාන්තා මිත්‍ර සංගමය පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරන ලද අතර ඔවුන්ගේ විශිෂ්ට කාර්යයන් දිගටම කරගෙන යාම සඳහා ඔවුන්ව දිරිමත් කරන ලදි. බයිබල් අධ්‍යයනය, යාච්ඥාව ක්‍රියාකාරකම්වල යෙදීම සහ කාන්තා මිත්‍ර සංගම් රැස්වීම් පැවැත් වූ අතර සභාවේ පූජකතුමාට සහයෝගය දක්වන ලෙස අවධාරණය කළ අතර අරමුදල් රැස් කිරීම සම්බන්ධව ද සාකච්ඡා කරන ලදි. එළිමහන් ක්‍රීඩාවකින් පසුව කාන්තා මිත්‍ර සංගමයේ සාමාජිකයින්ට ලාංජන පැළඳවීම සිදුකරන ලදි. ශාඛාවේ ක්‍රියාකාරකම් සහ රැස්වීම් ස්වාධීනව පවත්වා ගෙන යාමට තිබෙන්නා වූ කැපවීමේ ප්‍රවේශය ගැන සැබවින්ම ප්‍රබෝධමත්ය. මෙම ශාඛාව අනෙක් ශාඛාවන්වලට ආදර්ශමත් ආකෘතියක් ලෙස සේවය කරයි. ඔවුන්ගේ කැපවීම හා වගකීම ගැන පැසසුම් කරන ලදි. ගරු සැම් තුශාන්තන් පියතුමා සමඟ සාමාජිකාවන් හත් දෙනෙක් සහභාගි වූහ.

## දික්ඔය ක්‍රිස්තු දේවස්ථානයේ රැස්වීම



දික්ඔය ක්‍රිස්තු දේවස්ථානයේ දි ගරු එස්. කේ. ඩැනියල් පියතුමා සහ කාන්තාවන් කිහිපදෙනෙකු සමඟ ඵලදායි රැස්වීමක් පවත්වන ලදි.

අරමුදල් රැස්කිරීමේ සාකච්ඡාව කාන්තා මිත්‍ර සංගමයේ සභාපතිනිය ග්‍රේස් එඩ්වින් මහත්මිය මච්චරුන්ගේ සංගමයේ හිටපු සභාපතිනිය ප්‍රමිලා සැම් මහත්මිය හා කාන්තාවන් කිහිපදෙනෙකු විසින් කරන ලදි.

තරුණ ගැහැණු හා පිරිමි ළමුන් වෙනුවෙන් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩ සටහනක අවශ්‍යතාවයක් තිබෙන බවට ගරු එස්. කේ. ඩැනියල් පියතුමා අවධාරණය කල අතර, ඊට අමතරව සැලකිය යුතු සංවර්ධනයක් පිළිබඳව ප්‍රකාශයක් ද කරන ලදි. මාසයේ 5 වන ඉරු දින මෙහෙය, කාන්තා මිත්‍ර සංගමය විසින් පවත්වන අතර දැනට සිච්වන ඉරු දින මෙහෙය මච්චරුන්ගේ සංගමය විසින් කරනු ලැබ. මෙය විශිෂ්ට ඉදිරි පියවරකි.

## ගාලු අනුනායක බල ප්‍රදේශයේ සම්බන්ධීකාරක නිළධාරිනී විසින් බැහැ දැකීම.



## බෝන විස්ටා අන්වෙසක් වීමේ දේවස්ථානය

මැයි මස 5 වන දින දකුණු පලාතේ තුෂාරි ප්‍රනාන්දු මහත්මිය (කලාපීය සම්බන්ධීකාරක නිළධාරිනී) බෝන විස්ටා සභාවේ උදෑසන 7 දේව මෙහෙයට සහභාගී වූවාය. දේව මෙහෙයේදි දේව වචනය කියවීම සඳහා ඇයට ගරු අනුනායක සුනිල් ශාන්ත ගුණතිලක පියතුමා විසින් ඉතා කරුණාවෙන් ආරාධනා කරන ලදි. දේව මෙහෙයෙන් අනතුරු ව පැවතුණ කාන්තා මිත්‍ර සංගමයේ රැස්වීමට අනුනායක පියතුමා සහ ඔහුගේ භාර්යාව, පද්මශිලි සහෝදරී සහභාගි වූහ.

අනුනායක තුමා වන සුනිල් ශාන්ත ගුණතිලක ඔහුගේ වටිනා කාලය කාන්තා මිත්‍ර සංගමයේ රැස්වීම වෙනුවෙන් කැපකිරීම ගැන අපගේ කෘතඥතාවය පළ කර සිටිමු. කාන්තා මිත්‍ර සංගමයේ දායකත්වයේ වැදගත්කම ගැන අවධාරණය කරමින් ඔහුගේ පූර්ණ සහයෝගය ලබා දුන්නේය. මෙම දිරිගැන්වීම දකුණු පලාතේ පිහිටුවා ඇති කාන්තා මිත්‍ර සංගමයට සැලකිය යුතු ප්‍රමාණයක ශක්තියකි. රැස්වීමේදී ප්‍රධාන ක්‍රියාකරකම් කිහිපයක් සහ ඉදිරි සැලසුම් පිළිබඳව සාකච්ජා කර එකඟතාවයකට පැමිණ ඇත.

### සියලු ශාන්තුවරයන්ගේ සභාව, ගාල්ල

කලාපීය සම්බන්ධීකාරක නිළධාරිනි තුෂාරි ප්‍රනාන්දු මහත්මියට මෙම වැඩ කටයුතු දිගටම කර ගෙන යාම පිණිස මහනාම පූජකතුමා උණුසුම් ලෙස දිරිමත් කළේය. පසුගිය කාලයේ දී කාන්තා මිත්‍ර සංගමයෙන් ලැබුණා වූ උපකාරය ගැන සාමාජිකාවන් ඔවුන්ගේ ස්තුතිය පළ කළ අතරම වර්තමානයේ දී ඔවුන් විසින් මුහුණදෙනු ලබන අභියෝගයන් ඒත්තු ගත් අතර අනාගතයේදී කාන්තා මිත්‍ර සංගමය සමඟ වැඩ කිරීමට කැමති බව ප්‍රකාශ කළහ. රැස්වීමට සාමාජිකාවන් දසදෙනෙක් සහභාගි වූහ.

## උඩරට ප්‍රාදේශිකයේ නුවරඑළිය අනුනායක බලප්‍රදේශයට සම්බන්ධීකාරක නිළධාරිනියගේ සංචාරය



### ශාන්ත මරියා දේවස්ථානය, බොගවන්තලාව

උඩරට කලාපීය සම්බන්ධීකාරක නිළධාරිනිය වන ජෙම්මා මෝසස් මහත්මිය විසින් අගෝස්තු 4 වන ඉරිදා දින බොගවන්තලාව ශාන්ත මරියා දේව ස්ථානය බැහැ දකින ලදි. ඉරු දින දේව මෙහෙය අවසන් වූ විගස කාන්තාවන් සහ තරුණියන් කාන්තා මිත්‍ර සංගමයේ රැස්වීමට සහභාගි වූහ. ගරු එඩ්වින් රාජ් පූජකතුමා සාමාජිකාවන්ව ඇමතිමෙන් අනතුරුව එම ස්ථානයෙන් පිටව ගියේ මස්කෙළිය සියලු සාන්තුවරයන්ගේ දේව ස්ථානයට යාමට තිබෙන බව පවසමිනි.

ජෙම්මා මෝසෙස් මහත්මිය කාන්තා මිත්‍ර සංගමයේ මාසික යාච්ඤාව, ඔරේන්ජ් ඩේ සහ කාන්තාවන් විසින් කල හැකි සුළු ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි හැඳින්වීමක් කළාය. වාර්තාගතකිරීම (ගොනු කිරීම) වැඩසටහන්, ක්‍රියාකාරකම් සූදානම් කොට අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුත්තේ කෙලෙස ද යන්නත් සාකච්ජා කරන ලදි.

කාන්තාවන් 12 දෙනෙක් සහ කනිෂ්ඨ සාමාජිකාවන් තිදෙනෙක් සහභාගි වූහ. කාන්තාවන්ගේ තලෙන්ත ඉදිරිපත් කරනු ලැබුවේ ගායනයෙන් සහ කට පාඩම් බයිබල් පද කීමෙන්ය. මේ සියලු දේ සම්බන්ධීකාරක නිළධාරිනි විසින් පටිගත කර තිබුණි. ඔවුහු සතුටු වූහ. අවසාන යාච්ඤාව කරනු ලැබුවේ කාන්තා මිත්‍ර සංගමයේ ශාඛා සභාපතිනිය වන කැතරින් කිරුබාකරන් මහත්මිය විසිනි.

ගරු එඩ්වින් රාජ් පූජකතුමාගෙන් ලැබුණා වූ උපකාරය සහ මඟ පෙන්වීම ගැන කෘතඥ වන අතර අපි එය අගය කරන්නෙමු. සියලු සාන්තුවරයන්ගේ සභාවේ කාන්තා මිත්‍ර සංගමය විසින් මෙම වැඩසටහන 2024 අගෝස්තු මස 25 වන දින පවත්වන ලදි. මෙහි මූලාශ්‍රය පිළිබඳව කාන්තාවන්ට සහ තරුණියන්ට හඳුන්වා දීම සඳහා අගරපතන පොලිස් මධ්‍යස්ථානයේ සාජන්ට් ඉනෝකා හෙට්ටිආරච්චි සහ කාන්තා පොලිස් කොස්තාපල් යන අයට කාන්තා මිත්‍ර සංගමය විසින් ආරාධනා කරන ලදි. ඇයව රැගෙන ආවේ ඇ වෙනුවෙන් සිංහළ පරිවර්තනය කල කාන්තා පොලිස් කොස්තාපල් වන ත්‍යාගරාජා සහ කාන්තා පොලිස් කොස්තාපල් වන නදිකා විසිනි. පුංචි දරුවන් විසින් මල් කළඹක් දී මෙම කණ්ඩායම පිළිගන්නා ලදි.

### ශාන්ත පාවුලුතුමාගේ දේවස්ථානය, පූණ්ඩලූඔය

අගොස්තු 25 වන දින ඉරිදා ජෙම්මා මහත්මිය ශාන්ත පාවුලුතුමාගේ දේවස්ථානයට ගියාය. පෙ.ව 11.15 සිට 12.15 දක්වා පැවැත්වුන කාන්තා මිත්‍ර සංගමයේ රැස්වීමට දේව මෙහෙයෙන් පසු සහභාගි වුවාය. කාන්තාවන් 16 දෙනෙක් සහ ළමයින් 10 දෙනෙක්ද පැමිණ සිටියෝය. ආරම්භක යාච්ඤාව ජෙම්මා මහත්මිය විසින් කරනු ලැබුවාය. ගිතිකාවෙන් පසු, හිටපු සභාපතිනිය වන පෙරීන් එඩ්වින් මහත්මිය විසින් රැස්වීම අමතන ලදි.

## කාන්තා මිත්‍ර සංගමය මූලස්ථානයේ කාර්යමණ්ඩලය විසින් ඌව ප්‍රදේශය බැහැ දැකීම

### ශාන්ත මාර්ක් දේවස්ථානය බදුල්ල

දිගු කාලයක් බලා සිටීමෙන් පසු ශාන්ත මාර්ක් දේවස්ථානය බදුල්ල බැහැ දැකීම සිදු වුයේ 2024 ජුලි 6 වන දිනයේ දිය. කොළඹ මූලස්ථානයේ සම්බන්ධීකාරක නිළධාරිනි මර්සි අරුලානන්දම් මෙනෙවිය විසින් මෙම ගමන ගරු ජෙන්සී මංජුකා සහ සම්බන්ධීකාරක නිළධාරිනී වන නිර්මලා මහත්මිය සමඟ සැලසුම් කරන ලදි.




කාන්තා මිත්‍ර සංගමය ගැන ඉදිරිපත් කිරීමක් කළ අතර කාන්තාවන්ගේ පිවිතුරුභාවය පිළිබඳව අවධානය යොමු කරමින් පණිවුඩයක් දේවිනි තිස්සාරච්චි මහත්මිය විසින් බෙදා දෙන ලදි. මෙය කාන්තාවන්ට සහ තරුණ ගැහැණු අය යේසුස් වහන්සේ කෙරෙහි ඔවුන්ගේ කැපවීම අලුත් කර ගැනීමට පෙලඹීමක් ඇති කෙරිණි. මෙම අන්තර් ක්‍රියාකාරී සැසි වාරයට සහභාගී වූවන් අතර සජීවී සහභාගීත්වයක් ඇති කරන ලදි. ඒ සමඟම නව කමිටුවක්ද තෝරා පත් කර ගන්නා ලදි.

සංග්‍රහක් වශයෙන් බනිස් සහ බීමක් සමඟ විවේක කාලයක් දෙන ලදි. කණ්ඩායම් ජායාරූප එම පරිසරයේම ගන්නා ලදි. ඉදිරි සැලසුම් පිළිබඳ සාකච්ඡා කිරීම කාන්තා මිත්‍ර සංගමයේ ලාංජන පැළඳීම සහ අයදුම් පත් සමඟ කාඩ් පත් ද බෙදා දෙන ලදි.

කාන්තා මිත්‍ර සංගමයේ ලෝක ඉලක්ක 3 සහ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක 4ට සමගාමීව (ගුණාත්මක අධ්‍යාපන) ඉංග්‍රීසි කථන ව්‍යාපෘතියක් හදිසි අවශ්‍යතාවය මත හඳුනාගනු ලැබිය. කොළඹ දී යලි ආරම්භ කරන ලද ප්‍රජා ව්‍යාපෘතියට දායකත්වය ලබා දීමට ද කැමැත්ත පළ කලහ. රැස්වීම දහවල් 1.30 ට අවසන් විය. ඉදිරි කාලයේ රැස්වීම් කාල සටහන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධව කමිටුව තීරණය කරනු ඇත.

තරුණ ගැහැණු ළමයින් සැලකිය යුතු සංඛ්‍යාවක් සහභාගි වූ අතර විවිධ වයස් කාණ්ඩවලින් යුත් කමිටුවේ නියෝජනය ශාඛාවේ අනාගතයට යහපත් වනු ඇත.

## ගාල්ල බල ප්‍රදේශයේ රචනා තරඟය

අපගේ ප්‍රාදේශීය සම්බන්ධීකාරක නිළධාරිනී වන තුෂාරි ප්‍රනාන්දු මහත්මිය විසින් ආරම්භ කරන ලද රචනා තරඟය දකුණු ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙමින් පවතී. සහභාගි වෙන්නා වූ සභාවන් වන්නේ අතර ක්‍රිස්තු දේව ස්ථානය හම්බන්තොට ඇතුළුව, සියලු ශාන්තුවරයන්ගේ දේව ස්ථානය ගාල්ල, අන්වෙසක් වීමේ දේවස්ථානය බොනවිස්ටා, ක්‍රිස්තු දේව ස්ථානය බද්දේගම, ශාන්ත ලූක්තුමාගේ දේවස්ථානය දෙනියාය, සහ ක්‍රිස්තු දේවස්ථානය බෙවලි.

මෙහි ප්‍රධාන අරමුණ වන්නේ කුඩා දරුවන් ඔවුන්ගේ අධ්‍යාපනය කෙරෙහි දිරිගැන්වීම සහ වෙනත් හැකියාවන් තිබෙන දරුවන්ට පමණක් නොව සෑම දරුවෙකුටම මෙම තරඟයට සහභාගිවීමට අවස්ථාවක් ලබා දීමයි.

මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය වෙනුවෙන් වසමේ සෑම පූජකවරුන් ගෙන් උද්යෝගිමත් සහයක් ලැබුණි. සම්පූර්ණ කරන ලද රචනා තරඟය ගැන අපගේ ඊළඟ පුවත් පත්‍රිකාවේ කියවීමට බලාපොරොත්තු වන්න!

## දික්ඔය ක්‍රිස්තු දේවස්ථානයේ කාන්තා මිත්‍ර සංගම් ශාඛාවේ වෙළඳ කුටි



දික්ඔය ක්‍රිස්තු දේවස්ථානයේ කාන්තා මිත්‍ර සංගමය ශාඛාවේ පළමු වෙළඳාම ජූනි මස 30 වන දින දේවස්ථාන පරිශ්‍රයේදී සිදු කරන ලදි. ආසන්න වශයෙන් 75 දෙනෙක් මේ අවස්ථාවට පැමිණ සිටියහ. දේවස්ථානයේ දේව මෙහෙයෙන් පසු කාන්තාවන් තිදෙනෙක් විකුණුම් මේස සංවිධාන කළහ. කාන්තා මිත්‍ර සංගමයේ සාමාජිකයින් සහ ඩැනියල් මහත්මිය ඇතුළු ව (ගරු ඩැනියල් පියතුමාගේ භාර්යාව) සුදර්ශනී ජේකබ් මහත්මිය, පෝල් මහත්මිය, ග්‍රේස් එඩ්වින් මහත්මිය, චිත්‍රා සහ මහේෂ් තයාලන් යන අය කලාප කාර්යාලයේ සහයෝගය ඇතිව වෙළඳාමට අවශ්‍ය දේවල් පරිත්‍යාග කළහ.

වෙළඳාමෙන් ලැබුණ මුලු ගණන වන රු.4,400ක ආදායම ශාඛාවේ අවශ්‍යතාවයන්ට යෙදවීම පිණිස කාන්තා මිත්‍ර සංගමයේ භාණ්ඩාගාරික වෙරෝනිකා රත්නරාජ් මහත්මියගේ ගිණුමට ජූලි මස 1 වන දින බැර කරන ලදි.

මෙම අලෙවියේ සුවිශේෂ ලක්ෂණය නම්, සහභාගි වූ කාන්තාවන් විසින් තමන්ගේ මුදල් භාවිතා කරමින් සාදා ගෙන ආ විවිධ වර්ගයේ ආහාර විකුණා එම මුදල් කාන්තා මිත්‍ර සංගමය වෙනුවෙන් ත්‍යාගශීලිව පරිත්‍යාග කරන ලදි. ඔවුන්ගේ පරාර්ථකාමී කැපවීම අගය කරමු.

## සියලු සාන්තුවරයන්ගේ සභාව මස්කෙලිය, සබත් පාසැල් දිවා ආහාර වේල

මෙම ව්‍යාපෘතිය 2023 ජූනි මස 25වන දින ආරම්භ කළ නමුත් විවිධ හේතූන් මත නවත්වන ලදි. මෙතරම් අවශ්‍යතාවයක් තිබෙන ව්‍යාපෘතිය 2024 ජූලි මස 14 වන දින නැවත ආරම්භ කළ බවට සතුටින් දැනුම් දෙන්නෙමු.

## 2024 ජූලි මස 20 වන දින පවත්වන ලද කාන්තාවන්ගේ සන්ධ්‍යා කෝපි සාදය, කොළඹ



කාන්තාවන්ගේ සන්ධ්‍යා කෝපි සාදය **"විලාසිතාමය කාන්තාවන් විසිතුරු තොප්පි සමඟින්"** යන තේමාව යටතේ කාන්තා මිත්‍ර සංගමයේ මූලස්ථාන ශාලාවේ අති සාර්ථක ලෙස පැවැත්වුනි. මෙම සාදයේ සාමාජිකයින්ගේ සුහදතාවය වර්ධනය කිරීම හා කාන්තා මිත්‍ර සංගමයේ සාමාජිකත්වය පුළුල් කිරීමේ මූලික අරමුණ ඉෂ්ඨකර ගන්නා ලදි.



කාන්තාවන් හා තරුණියන් විචිත්‍රවත් ඇඳුමෙන් සැරසී නිර්මාණශීලි හිස් වැසුම් සමඟ පැමිණ එදින සවස් වේලාව සිනහවෙන්, විනෝදයෙන් සහා සහභාගිත්වයෙන් ගතකරන ලදි. "ප්‍රෝබයොටික් සහ ප්‍රතිජීවක" යන ප්‍රධාන දේශනය කාන්තා මිත්‍ර සංගමයේ සාමාජිකාවක් වන වෛද්‍ය ප්‍රියන්ති මොල්ලිගොඩ මහත්මිය විසින් තොරතුරු සහිත සහ සිත් ඇද ගන්නා සුළු දේශනයක් පවත්වන ලදි. වත්මන් ලෝක සභාපතිනිය ජීන් විතානගේ මහත්මිය සුන්දර අතීතය සම්බන්ධව කරුණු එකතු කරමින් කාන්තා මිත්‍ර සංගමයේ ඇයගේ තරුණ කාලය මතකයන් සිහිපත්කර අර්ථවත් මතකයන් බෙදාගත්තාය.

තමතමන්ව හඳුන්වා දීම ඇතුළුව තව කෙනෙකුට පණිවුඩ දීම සහ කතාන්දර කීම යනාදි විවිධ ක්‍රීඩා, සහභාගි වන්නන්ට විනෝදාශ්වාදයක් ලබා දුන්නේය. මෙම උත්සවය සජීවී නර්තන වේදිකාවකින් සමන්විත වූ අතර සහභාගි වූවෝ හද තෘප්තියෙන් නැටුවෝය!

කාන්තා මිත්‍ර සංගමයේ මුළුතැන් ගෙහි සාදනලද ප්‍රණීත සංග්‍රහයක් සන්ධ්‍යා කාලයේ රසවින්දනයට එකතු විය. කාන්තා මිත්‍ර සංගමයේ එග්ලා කමලේන්තිරන්, සන්දීපනි ජයසිංහ, ඇලිෂා පියරත්න සහ ෂෙලෝමි ජීවනාදන් යන කනිෂ්ඨයන්ගේ දායකත්වය මෙම වැඩ සටහනේ සාර්ථකත්වයයි උපාංගයක් විය. එග්ලාගේ මව වන කමලේන්තිරන් මහමියගේ කැප වීම සහ අලංකාර හිස් වැසුම් සැදීම තරුණ ගැහැණු ළමයින් සමඟ ඇගේ අත්දැකීම් බෙදා ගැනීම නිසා ඇයට විශේෂ පිළිගැනීමක් පිරිනැමුනි.

මෙම වැඩසටහන සාර්ථකලෙස කරගැනීමට දායකවූ සැමට අපගේ අවංක කෘතඥතාවය පුද කරමු. නුදුරු අනාගතයේදි මේ හා සමාන සහභාගිත්ව වැඩ සටහන් පැවැත් විමට අපි බලාපොරොත්තු වන්නෙමු.



## බදුල්ල ශාන්ත මාර්ක් දේවස්ථානය, ශාඛාව විසින් පවත්වන ලද ශ්‍රමදානය

ආරම්භ කරනු ලැබුවේ පෙ.ව.10 පමණය. සුසාන භූමිය සහ දේවස්ථානය අවට කාන්තාවන් විසින් පිරිසිදු කරන ලදි. ඒ අය වෙනුවෙන් උදැසන ආහර වේලක් ලබා දෙන ලදි. මෙයට සහභාගි වීමට අපහසු අය විසින් උදැසන ආහාර වේලට සහයෝගයක් ලබා දෙන්නේ නම්, එය යහපත් දෙයක් යැයි පසුගිය දේව මෙහෙයේදි නිවේදනය කරන ලදි. මේ වෙනුවෙන් රු 3,000 ක මුදලක්ද එකතුකර ගැනීමට හැකි වුනි. කෙසේ හෝ අයහපත් කාළගුණය නිසා ප.ව. 2 වන විට වැඩ අවසන් කරන ලදි.



සුසානභූමිය පිරිසිදුකල යුතුයැයි දැනුනේ විදේශිකයින්ව පවා භූමදාන කර තිබෙන නමුත් එය නඩත්තු කිරීමට හෝ පවත්වාගෙන යාමට කෙනෙක් නොමැති බැවිනි. ඒ සියලුදෙනා එක්ව කල මෙම කාර්යය ගැන සෑහීමට පත්වන බව ඔවුහුම කියා සිටියෝය. මෙම ක්‍රියාකාරකම සිදුකල දවසේ කාන්තාවෝ සහ ගැහැණු ළමයි හොඳ සහභාගිත්වයක් සහ මිත්‍රත්වයක් ඇති කර ගත්හ. ගරු මංජුකා පූජකතුමියගේ ප්‍රසාදයද ලැබුවෝය.

## එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක 3

**හොඳ සෞඛ්‍ය සහ යහපැවැත්ම අංක 3.5**

**මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීමේ වැඩසටහන තංගල්ලේදී පැවැත්වුනි**

කාන්තා මිත්‍ර සංගමයේ වැඩ කරන්නේ ලෝක ඉලක්ක 2 හරහා ඉහත වැඩ සටහන අගෝස්තු 2023 හා සම්බන්ධ වේ.

ගරු. අමිල ප්‍රනාන්දු පූජකතුමාගේ ඉල්ලීම පරිදි 2024-අගෝස්තු මස කරන ලද වැඩසටහනට වැඩිහිටියන් 15 දෙනෙකු සහ ළමුන්ද සහභාගි වුන බව දන්වන්නට කැමැත්තෙමු. ගරු. අනිල් වික්‍රමසිංහ සහ ගරු. අමිල ප්‍රනාන්දු යන පූජකවරු. ආරම්භයේ සිට අවසානය දක්වාම රැඳී සිටියහ

ගාල්ල වොයිස් ඔෆ් නිව් ලයිෆ් සෙන්ටර් ආයතනයේ මංජුල ප්‍රසාද් මහත්මා විසින් මෙම වැඩසටහන ඉතා ඵලදායි ලෙස පවත්වන ලදි.




වැඩසටහන හරහා පහත සඳහන් අංශයන් සම්බන්ධවද දැනුවත් කරන ලදි. තරුණ ජිවිතවල ඇති වටිනාකම සහ දෙවියන්වහන්සේ විසින් අපේ ජීවතයට දි තිබෙන වටිනාකම නිසාත් අපි ඇබ්බැහිවීම් වලින් නිදහස්ව සිටියයුතු අතර, මෙවැනි දේ වලින් නිදහස්ව සිටීමට කල යුත්තේ කුමක්ද සහ කෙසේද යන්න පිළිබඳ දැනුම ලබා දෙන ලදි.



ළමුන් වෙනුවෙන් සැසිවාරය පෙ.ව. 9 වන විට ආරම්භ කොට පැය එකහමාරක කාලයක් පමණ පවත්වන ලදි. ළමුන්ට දෙනලද ක්‍රියාකාරකම් ඔවුහු ඉතා උනන්දුවෙන් කළහ. විවේකයකින් පසු වැඩිහියන් සඳහා සැසිවාරය පැවැත්විණි. ළමුන් ඇබ්බැහිවම්වලට යොමු වන ආකාරය සහ ඔවුන් නිවැරදි මාර්ගයට යොමුකර වන්නේ කෙසේද යන වැදගත් අංශ රාශියක් පිළිබඳව සාකච්ජා කරන ලදි.

බලාපොරොත්තු වුවාට වඩා සහභාගි වුවන්ගේ සංඛ්‍යාව අඩු වුවද එය මෙම වැඩසටහනට බලපෑමක් නොවුනි. ඵලදායි ලෙස පවත්වන ලද මෙම වැඩසටහන වෙනුවෙන් මංජුල ප්‍රසාද් මහත්මාට සහ ඔහුගේ කණ්ඩායමට, අපගේ අවංක ස්තුතිය පුද කරමු. මෙවැනි උසස් ප්‍රමිතියෙන් යුත් වැඩ සටහනක් ප්‍රජාව වෙත ලබා දිමට හැකිවීම ගැන අපි සතුටු වන්නෙමු.

මෙම වැඩසටහනට අනුග්‍රහය දැක්වූ සර්ව් නව් ආයතනයට අපගේ හෘදයාංගම ස්තුතිය පුද කර සිටිමු.

**"දැන් මට පැහැදලිව කියවන්න පුළුවන් සහ මට මගේ පාඩම් වැඩ කටයුතුද හොඳින් කරන්න පුළුවන්." මම කාන්තා මිත්‍ර සංගමයට ස්තුතිවන්ත වෙමි."**

## හරිෂාන්නට නැවතවරක් පෙනීම ලැබුණි !

කාසල්රේ වතුයායේ සිටින හරිෂාන්ගේ වයස අවු: 16යි. ඔහුගේ ඇස් පෙනීමේ දුර්වලතාවය නිසා දිනපතා ඔහුට අභියෝගයන් වලට මුහුණ දෙන්නට සිදුවීය. කළුලෑල්ල බලාගෙන කියවන්නට අපහසු වූ බැවින් ඔහුගේ අධ්‍යාපන මට්ටම සැලකිය යුතු ප්‍රමාණයකට අඩුවිය. එම නිසා ඔහුගේ සම වයසේ මිතුරන් සමඟ එකට සිටීම අභියෝගයක් විය. ඔහුගේ මෙම දෘශ්‍යාබාධ තත්වය නිසා සරල ක්‍රියාකාරකම් වන ක්‍රිකට් සෙල්ලම් කිරීම, පාර මාරු වීම, සෙනඟ ගැවෙසෙන ස්ථානවල සැරිසැරීම යන මෙවැනි දේවල්වලට පවා කෙතරම් බලපානවද කියා ඔහුගේ මිතුරෝ විස්තර කළහ. මෙවැනි බාධා තිබියදීත් හරිෂාන්ගේ අධිෂ්ඨානය වූයේ නොසැලී සාර්ථක වීමයි.

දුෂ්කරතා හමුවේ, කැපීපෙනෙන ධෛර්යයෙන් යුතුව සහ ඊට අවනත වීමේ හැකියාව පෙන්නුම් කරමින් ලබන අවුරුද්දේ, අධ්‍යාපන පොදු සහතික (සා.පෙළ) විභායට ඔහු සූදානම් වෙමින් සටියි. හරිෂාන් ජීවත් වන්නේ ඔහුගේ මාමා සහ නැන්දනිය සමඟය.

වරක් ඔහු විශිෂ්ට ශිෂ්‍යයෙක්ව සිටියදී ඇස් පෙනීම අඩුවීමේ හේතුවෙන් 9 වන ශ්‍රේණියේදී අධ්‍යාපනයේ පහත වැටීමක් පෙන්නුම් කිරීමට ආරම්භ වුනි. දෘශ්‍යතාවය වැඩි දියුණු කරගැනීම හේතුවෙන් පන්තියේ ඉදිරි පස පේලියේ වාඩි වී සිටියදීත් ඔහුගේ පෙනීම දිගටම නරක අතට හැරුණි. කඩඉම් ලකුණු 167 බැවින් ශිෂ්‍යත්ව විභාගයට ඔහු ලකුණු 136 ක් ලබා ගෙන අසමත් වුණේය. ඔහු දැනට භාවිතා කරන කන්නාඩි කුට්ටම ලබා දුන්නේ ඔහු 9 වසරේ සිටියදිය. නමුත් එය දැන් කැඩී තිබෙන නිසා අකාර්යක්ෂම වී ඇත.



හරිෂාන්ගේ අභිලාෂය වුයේ ඉංජිනේරු වරයෙකු වීමටයි. ඔහුගේ තාවකාලික සුවය සඳහා මුලදී කන්නාඩි කුට්ටම ලබා දී තිබුනේ කොළඹ අක්ෂි රෝහලෙන්ය. කෙසේ හෝ මාස හයකින් පසු ඔහුගේ ඇස් පෙනීම නැවත වරක් දුර්වල විය. පසුව වෛද්‍ය උපකාර සඳහා නැවත වතාවක් කොළඹ අක්ෂි රෝහලට යාමට සිදුවුන නමුත් ඔහුගේ භාරකරුවන්ට මේ වෙනුවෙන් වියදම් දරන්නට හැකියාවක් නොතිබුනි. හරිෂාන්ගේ අධ්‍යාපනය දිගටම කරගෙන යාමට සහ ඔහුගේ යහපැවැත්මට මෙම මුදල් අඩුපාඩුව සැලකිය යුතු ප්‍රමාණයක බාධාවක් විය. ඔහුගේ ඇසෙහි බාධාව හඳුනාගනු ලැබුවේ සර්ව් නව් ආයතනය හා එක්ව සමරසිංහ දෘෂ්ඨි විශේෂඥ වරුන් විසින් මාර්තු 25 වන දින කාන්තා මිත්‍ර සංගමය හරහා පැවැත්වූ අක්ෂි කඳවුරේදිය.

මෙම පරීක්ෂණයෙන් පසු ඔහුට විශේෂ සැලකිල්ලක් අවශ්‍ය බව තිරණය විය. එම නිසා හැටන් ප්‍රදේශයේ පිහිටි නඩරාජා වැනලිං මධ්‍යස්ථානයේ සේවය කරන වෛද්‍යතුමිය, දිසානායක මහත්මියව මුණගැසිය යුතු යැයි කාන්තා මිත්‍ර සංගමය තිරණය කරන ලදි. දිගුකාලීනව නොසලකා හැරීම හේතුවෙන් වම් ඇසට සැලකිය යුත ප්‍රමාණයක හානියක් සිදු වී ඇති බැවින් නිරන්තරයෙන්ම කන්නාඩි භාවිතා කල යුතු බවට වෛද්‍යතුමිය නිර්දේශ කලාය. දකුණු ඇසත් යම් තාක් දුරට දුර්වල වී ඇති නමුත් එය එතරම් අවදානම් තත්වයක නැති බැවින් අලුත් කන්නාඩි කුට්ටමක් වෛද්‍යතුමිය නියම කල අතර පසුවිපරම් සඳහා මසකට වරක් වෛද්‍ය සායනයට පැමිණෙන ලෙසද දැනුවත් කලාය. අලුත් කන්නාඩි කුට්ටම ලැබුනායින් පසු හරිෂාන් අතිශයින්ම සතුටු වුනේය.





ඔහුගේ ක්ෂණික ප්‍රතිචාරය වුයේ කියවීමෙන් ඔහුගේ ඇස් පෙනීමේ මට්ටම පරික්ෂා කර ගැනීමයි. ඔහුගේ සතුට පිණිස අකුරුද පැහැදිලිව තිබුනි. ඔහුට අලුතින්ම ලැබුනාවූ හැකියාව නැන්දාගේ හදවතට ගැඹුරින්ම දැනෙන්නට විය. කෘතඥතාවයෙන් හද පිරුනේය. ඔහුගේ අධ්‍යාපන ගමනට පරිවර්තනීය බලපෑමක් හා සහයෝගයක් ලැබුන බව හරිෂාන් හඳුනා ගත් බැවින් ඔහුගේ හද පිරි ස්තූතිය කාන්තා මිත්‍ර සංගමය වෙනුවෙන් පුද කර සිටියේය. හරිෂාන්ගේ නැන්දා කාන්තා මිත්‍ර සංගමය වෙනුවෙන් ඇගේ බලවත් ස්තූතිය අපගේ ප්‍රාදේශිය සම්බන්ධිකාරක නිලධාරිනි වන ජෙම්මා මහත්මියට පළ කළාය. තවද ඇය මෙසේද කියා සිටියාය,

**අපි කාන්තා මිත්‍ර සංගමය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු. මම ඔහුව රැකබලා ගන්නා අතර ඔහුගේ කන්නාඩි කුට්ටම නිතරම පැළඳ සිටීමේ වගකීම මම භාරගන්නෙමි යනුවෙන්ය".** මෙම අක්ෂි කඳවුර සාර්ථක ලෙස කරගැනීම සඳහා පෞද්ගලික සහය දැක්වූ පරිත්‍යාගශීලීන් දෙදෙනාවන සමරසිංහ දෘෂ්ඨි විශේෂඥ තුමියටද, සර්ව් නව් ආයතනයටද, ගරු ඩැනියෙල් පියතුමාට සහ දික්ඔය ක්‍රිස්තු දේවස්ථානයේ කාන්තා මිත්‍ර සංගමයේ සාමාජිකයන්ගේ නොමසුරු සහයෝගය වෙනුවෙන් කාන්තා මිත්‍ර සංගමය අවංක ස්තූතිය පුද කර සිටියි. තරුණ ජීවිතයක් නඟා සිටුවීමට ඇති කළ ධනාත්මක බලපෑම සම්බන්ධව සාක්ෂි දීමත් ඉමහත් සතුටකි. මේ සියලු දේ සඳහා දෙවියන් වහන්සේට සියලු මහිමය ගෞරවය සහ ප්‍රශංසාව ලබා දෙන්නෙමු.

**ලෝක සභාවේ සභාපතිනිය**
පින් විතානගේ මහත්මිය

**කාන්තා මිත්‍ර සංගමයේ**
ගරු. නිරෝෂන් ද මැල් පියතුමා

**කාන්තා මිත්‍ර සංගමයේ**
අනුශාසක ක්‍රිස්ටෝපර් බාල්රාජ් පියතුමා

**විධායක සභාව**

**රෝහිණි රත්නම් මහත්මිය**
සභාපතිනිය

**සුගී ජෙබමනි මහත්මිය**
උප සභාපතිනිය

**මාසිඵා සෙනවිරත්න මහත්මිය**
උප සභාපතිනිය

**නිමාලි ගජසිංහ මහත්මිය**
ගරු භාණ්ඩාගාරික

**ක්‍රිෂාන්ති මැනුවල් මහත්මිය**
සහකාර භාණ්ඩාගාරික

**කාර්ය මණ්ඩලය**

**දේවිනි තිස්සාරච්චි**
ප්‍රධාන විධායක නිලධාරිනි

**ගයාත්‍රි ගජමන්ගේ**
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනි
පරිපාලන සහ මූල්‍ය

**සරිතා ප්‍රනාන්දු**
ජ්‍යෙෂ්ඨ විධායක
ගිණුම් සහ පාරිභෝගික සේවා

**මර්සි අරුළානන්දම්**
ව්‍යාපෘති සම්බන්ධිකාරක නිලධාරිනි

**නාමලි විතානගේ**
සහයක සේවා නිලධාරිනි

**තුෂාරි ප්‍රනාන්දු**
හම්බන්තොට කලාප කාර්යාල
සම්බන්ධිකාරක නිලධාරිනි

**ජෙම්මා මෝසස්**
දික්ඔය කලාප කාර්යාල
සම්බන්ධිකාරක නිලධාරිනි

58, Ananda Coomaraswamy Mawatha, Colombo 03, Sri Lanka.
+94 11 2 573214-5 / 011 2 573223, gfsofsrilanka@gmail.com
FB – Girls' Friendly Society, Sri Lanka, GFS Hall, Colombo 03,
GFS Sri Lanka : Women helping Women